*සැ. යු.-* (i) 2017.05.05 දින පළ වූ අංක 2018 දරන *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොවීය.
(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2017 වර්ෂය සඳහා ගාල්ල සහ බලපිටිය අධිකරණ කලාපවලට අයත් ජූරි සභිකයින්ගේ නාමාවලියක් භාෂාත්‍රයෙන්ම පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,019 - 2017 මැයි මස 12 වැනි සිකුරාදා - 2017.05.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 878 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 882 |

*සැ. යු.-* අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2017 මැයි මස 05 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 ජූනි මස 02 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 මැයි මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

875 - B 81169 — 5,403 (2017/05)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පෙරාතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

### ක්‍රීඩා නිලධාරින්ගේ ඒකාබද්ධ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණ සේවා ගණය III ශ්‍රේණිය ක්‍රීඩා පුහුණුකරු තනතුරට සීමිත බඳවා ගැනීම

ක්‍රීඩා නිලධාරින්ගේ ඒකාබද්ධ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණ සේවා ගණයේ ක්‍රීඩා පුහුණුකරු තනතුරේ පවතින පුරප්පාඩු 28ක් සඳහා සීමිත බඳවා ගැනීම යටතේ මධ්‍යම රජයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු මෙහි පහත සඳහන් සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *සුදුසුකම් :*

1.1 *අධ්‍යාපන සුදුසුකම් :*

(*අ*)

(i) සිංහල/දෙමළ/ඉංග්‍රිසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක්වරක දී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම;

සහ

(ii) අ. පො. ස. (උසස් පෙළ) විභාගයේ සියළුම විෂයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා ගෙන තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර);

සහ

(iii) ක්‍රීඩා අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලේ පළාත් මට්ටමින් (දිස්ත්‍රික් අතර) පැවැත්වෙන තරගයන්හිදී 1 හෝ 2 ස්ථානයන් ලබා තිබීම. ජාතික මහා ක්‍රීඩා උළෙලේ 1, 2 හෝ 3 ස්ථාන ලබා තිබීම. ක්‍රීඩා පනත යටතේ ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගම් මගින් පවත්වනු ලබන ජාතික ශූරතා තරගවල 1, 2 හෝ 3 ස්ථාන ලබා තිබීම.

හෝ

(*ආ*)

(i) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම;

සහ

(ii) දකුණු ආසියාතික තරග, ආසියාතික තරග, පොදු රාජ්‍ය මණ්ඩලීය තරග ඔලිම්පික් තරග හෝ ලෝක ශූරතා තරග සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කර 1, 2 හෝ 3 ස්ථාන සඳහා පදක්කම් ලබා තිබීම.

1.2 *වෘත්තීය සුදුසුකම් :*

(i) තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හය (06) මට්ටමේ වන්නාවූ ක්‍රීඩා ක්ෂේත්‍රයට අදල තාක්ෂණික ඩිප්ලෝමාව ලබා තිබීම.

(ii) ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව පිළිගත් ආයතනයක් විසින් අදල ක්‍රීඩාව සඳහා පවත්වනු ලැබූ මාස තුනකට (03) නොඅඩු පුහුණුකරු පාඨමාලාවක් හදරා සමත් වී තිබීම හෝ ක්‍රීඩා පනත යටතේ අදල ක්ෂේත්‍රයට නියමිත ක්‍රීඩා සංගමය විසින් නිකුත් කරන ලද පුහුණුකරු බලපත්‍රයක් ලබා තිබීම.

1.3 *පළපුරුද්ද :*

(*අ*) මධ්‍යම රාජ්‍ය සේවයේ ක්‍රීඩා නිලධාරීන් සඳහා ක්‍රීඩා නිලධාරී තනතුරේ වසර අට (08) ක සක්‍රීය හා සතුටුදයක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ වැටුප් වර්ධක අට (08) ක් උපයාගෙන ඇති ක්‍රීඩා නිලධාරියෙකු වීම.

(*ආ*) පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා
ක්‍රීඩා ක්ෂේත්‍රයට අදල ක්‍රීඩා නිලධාරී තනතුරට සමාන තනතුරක අවම වශයෙන් වසර අට (08)ක සක්‍රීය හා සතුටුදයක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර කරන ලද නිලධාරියෙකු වීම.

1.4 *කායික සුදුසුකම් :*
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

**සටහන**

පළමුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා මධ්‍යම රජයේ ක්‍රීඩා නිලධාරින් බඳවා ගනු ලැබේ. එලෙස මධ්‍යම රජයේ ක්‍රීඩා නිලධාරින් බඳවා ගැනීමෙන් පසු තවදුරටත් පුරප්පාඩු පවතින්නේ නම් පමණක් පළාත් රාජ්‍ය සේවයේ නිලධාරින්ගෙන් සීමිත ධාරාව යටතේ ඇති සුදුසුකම් අනුව ඉතිරි පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

1.5 *වෙනත් සුදුසුකම් :*

(i) පත්වීම ස්ථිර කර තිබීම.
(ii) අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව සුදුසුකම් පරීක්ෂා කිරීමේ දිනට පෙරාතුව වූ වසර අට (08) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
(iii) පූර්වාසන්න වසර පහක් (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
(iv) අදල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා ලබාගෙන තිබීම.
(v) අදළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වී තිබීම.
(vi) ඉහත සඳහන් සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

2. **යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :**

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරාගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක සේවා පළපුරුද්ද | 30 | අදළ නොවේ. |
| අතිරේක අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් | 25 | |
| ක්‍රීඩා නිලධාරී තනතුරේ දක්වන ලද දක්ෂතා | 20 | |
| ක්‍රීඩා පුහුණු කිරීම, තරග විනිශ්චය/තරග සංවිධානය පිළිබඳ අතිරේක පළපුරුද්ද | 20 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා | 05 | |
| **එකතුව** | 100 | |

- ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ ක්‍රීඩා නිලධාරී තනතුරට බඳවා ගැනීමේදී ඉදිරිපත් කරන ලද සහතික සඳහා නැවත ලකුණු ලබා දෙනු නොලැබේ.
- සුදුසුකම් පරීක්ෂා කිරීමද, යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දීම සිදු කරනු ලබයි.
- යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව අයදුම්කරුවන් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවයේ III ශ්‍රේණිය ක්‍රීඩා පුහුණුකරු තනතුරට බඳවා ගනු ලැබේ.

03. **මාසික වැටුප් පරිමාණය :**

2016.02.25 වැනි දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන 1 අනුව මෙම තනතුරට අදල මාසික වැටුප් පරිමාණය රු. 31,040-10 x 445 - 11 x 660 - 10 x 730-10 x 750-රු. 57,550 (MN-3-2016) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ. මෙයට අමතරව රජයේ නිලධාරීන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමි වේ.

04. **අයදුම්පත් යොමු කිරීම**

4.1 අයදුම්පත්කරුවන් විසින් මෙම නිවේදනයේ අග දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ආයතන ප්‍රධානියා මඟින් 2017.06.02 වැනි දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

4.2 *අයදුම්පත්‍ර යොමු කිරීම :*
අධ්‍යක්ෂ ජනරාල්,
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව,
අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

4.3 අයදුම්පත් බහා ඇති ලිපි කවරයේ වම්පස ඉහල කෙළවරේ පැහැදිළිව ''ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණ සේවා ගණයේ ක්‍රීඩා පුහුණුකරු තනතුරට බඳවා ගැනීම'' යනුවෙන් පැහැදිළිව ලිවිය යුතුය.

05. සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

06. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

6.1 මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය.

6.2 *සේවා කොන්දේසි :*

සෑම පත්වීමක්ම සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදල වේ.

07. තමා දැනුවත්ව ඉදිරිපත් කරන ලද යම් කිසි තොරතුරක් අසත්‍ය බව පෙනීගියහොත් හෝ අයදුම්කරු/අයදුම්කාරිය හිතාමතාම යම්කිසි වැදගත් කරුණක් යටපත් කර ඇති බව පෙනී ගියහොත් එසේ නැතහොත් නුසුදුසු බව සේවය කරන කාලය තුළ කවර අවස්ථාවකදී හෝ ඔප්පු වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වනු ඇත.

එස්. ඊ. ආර්. ටී. එම්. එස්. පී. බණ්ඩාර,
අධ්‍යක්ෂ ජනරාල්.

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව,
අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

2017 අප්‍රේල් මස 26 වැනි දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව***

*ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණ සේවා ගණය III ශ්‍රේණිය ක්‍රීඩා පුහුණුකරු තනතුරට සීමිත බඳවා ගැනීම*

| | |
|---|---|
| මධ්‍යම රජය | |
| පළාත් රාජ්‍ය සේවය | |

(මෙම ඔබ අයත්වන සේවය ඉදිරියේ " ✓ " ලකුණ යොදන්න.)

01. සම්පූර්ණ නම :————.
02. (අ) මුලකුරු සමග නම : උදා :- (GUNAWARDANA M. G. B. S. K.)
(ඉංග්‍රීසි කැපිටල් අකුරින් පිරවිය යුතුයි)

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

03. ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

04. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
05. ස්ථිර ලිපිනය :————.
06. කාර්යාලීය ලිපිනය :————.
07. දුරකථන අංකය :————.
08. ගැසට් නිවේදනයේ I ඡේදයේ සඳහන් සියළුම සුදුසුකම් සපුරා තිබේ ද ? :————.
09. අධ්‍යාපන සුදුසුකම් :

(අ) අ. පො. ස. (සා. පෙළ විභාගය)
වර්ෂය :————.
විභාග අංකය :————.

| *අනු අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

(ආ) අ. පො. ස. (උ. පෙළ.)
වර්ෂය :————.
විභාග අංකය :————.

| අනු. අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

10. වෘත්තීය සුදුසුකම් : (අදාළ සහතිකවල, සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමග ඉදිරිපත් කරන්න.) :————.

11. පළපුරුද්ද :————.

12. දැනට දරන තනතුර :————.

12.1 එම තනතුර අයත් වන්නේ මධ්‍යම රාජ්‍ය සේවයට ද, පළාත් රාජ්‍ය සේවයට ද යන්න. :————.

12.2 එම තනතුරට පත් වූ දිනය :————.

12.3 එම තනතුරේ ස්ථිර කළ දිනය :————.

12.4 2017.01.01 වැනි දිනට සේවා කාලය අවු. :————. මාස :————. දින :————.

12.5 දැනට සේවය කරන ස්ථානය :————.

13. ඔබ කිසියම් වරදක් සඳහා උසාවියකින් දඬුවම් ලබා හෝ දැනට ඔබට එරෙහිව සිදු කෙරෙමින් පවතින අධිකරණ ක්‍රියා මාර්ග යක් පවතී ද ? ඔව්/නැත

13.1 ඔව් නම් විස්තර සඳහන් කරන්න.

14.. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් ලබා ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එය ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දැන සිටිමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

15. මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..................... මයා/මිය/මෙනවිය මධ්‍යම රජය යටතේ වන/පළාත් රාජ්‍ය සේවය යටතේ වන ................. /අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුවේ ........................ තනතුරක සේවය කරන බව ද, 2017.01.01 දිනට පූර්වාසන්නයෙන් වූ අවුරුදු 8ක සක්‍රිය සේවා කාලයක් තුළ කළ වරදකට (අවවාද කිරීම් හැර) කිසියම් ආකාරයක විනයානුකූල දඬුවමකට ඔහු/ඇය භාජනය නොවූ බවද, පූර්වාසන්න අවුරුදු පහක (05) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සහිත බවද, අදාල *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ලබා ඇති බව ද, මෙම තනතුර සඳහා තෝරා ගතහොත් දැනට දරන තනතුරෙන් මුදවා හරින/නොහරින බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී මෙම අයදුම්පත්‍රය අත්සන් කළ බව ද මෙයින් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ආයතනය/ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

දිනය :————.

05-329

# විභාග, විභාග, ප්‍රතිඵල ආදිය

**ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය**

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ තාක්ෂණ නිලධාරි තනතුරට බඳවා ගැනීම - 2017**

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ තාක්ෂණ නිලධාරි තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. *විභාගය* :
2017 අගෝස්තු මාසයේදී ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට අනුකූලව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් විභාගය පවත්වනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

03. *සේවා කොන්දේසි* :
රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසි වලට ද, මෙහි පහත සඳහන් කොන්දේසිවලට ද, යටත්ව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ තාක්ෂණ නිලධාරි තනතුරට බඳවා ගනු ලැබේ.

(i) පත් කරනු ලබන නිලධාරියා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත් වේ.

(ii) මෙම තනතුර ස්ථිරය. ***සටහන*** - විශ්‍රාමික වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතු ය.

(iii) විවෘත බඳවා ගැනීම් යටතේ පත්කරනු ලබන නිලධාරීන් වසර 3ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කරන ලද නිලධාරියකු පත් කරනු ලැබුවහොත්, එක් වසරක පරීක්ෂණ කාල සීමාවකට යටත් කරනු ලැබේ. විවෘත බඳවා ගැනීම් තුළින් පත් කරනු ලබන නිලධාරීන් තනතුරේ ස්ථිර කිරීමට පෙරාතුව, නියමිත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්ව තිබීම ද අවශ්‍ය වේ.

(iv) රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුනු රාජ්‍ය භාෂාවකට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතාවයක් සේවයට බැඳී වසර 05ක් තුළ ලබාගත යුතු ය.

(v) පත්වීම් ලබන නිලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලට ද, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද, කාර්ය පරිපාටික රීතිවලට ද, රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන නියමයන් හා රෙගුලාසිවලටත් අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ රෙගුලාසි වලටත් යටත් වේ.

04. *වැටුප් පරිමාණය* :
MN-3-2016 - තාක්ෂණ නිලධාරි III
රු. 31,040-10x445-11x660-10x730-10x750-රු. 57,550

මෙම වැටුප් පරිමාණයේ රු.: 31,040/-10x445-11x660-10x730-10x750-රු. 57,550 වැටුප් පියවරයන් මෙම ශ්‍රේණියට හිමි වේ. (වැටුප් ගෙවනු ලබන්නේ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි උපලේඛන 11 හි සඳහන් පරිදි ය)

III ශ්‍රේණියේ නිලධාරීන් තුන්වන වැටුප් වර්ධකය ලැබීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය.

05. ***වයස් සීමාව*** :

*අවම සීමාව* : වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු ය.
*උපරිම සීමාව* : වයස අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

06. ***අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්*** :

අධ්‍යාපන සුදුසුකම් :

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වී තිබීම.;

සහ

ව්‍යවහාරික ගණිතය, ශුද්ධ ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතරින් විෂයයන් දෙකක් සහිතව විද්‍යා/ගණිත විෂය ධාරාවන්ට අයත් විෂයයන් තුනකින් අ. පො. ස. (උසස් පෙළ) විභාගය එකවර සමත්වීම.

*වෘත්තීය සුදුසුකම්* :

මොරටුව විශ්වවිද්‍යාලයේ හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු (සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා) ඩිප්ලෝමාව;

හෝ

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත ආයතනයක් විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු (සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා) ඩිප්ලෝමාව

හෝ

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණ ඩිප්ලෝමාව;

හෝ

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළවන කොටස (සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා) සාර්ථකව සම්පූර්ණ කිරීම;

හෝ

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම්වලට සියලු අතින් සමානයැයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් තාක්‍ෂණික සුදුසුකම් ලබා තිබීම.

*කායික සුදුසුකම් :*

මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු අතර, මනා ශරීර සෞඛ්‍ය තත්ත්වය වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මගින් සනාථ විය යුතු ය.

*වෙනත් සුදුසුකම් :*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.
(ii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
(iii) සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාග යට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ, අයදුම්කරු අදළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

07. ***බඳවා ගැනීමේ ක්‍රමය*** :-

සියලු බඳවා ගැනීම්, අදළ චක්‍රලේඛ උපදෙස් අනුව හා ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට අදළව සිදු කෙරේ.

විවෘත තරග විභාගය සඳහා නියමිත සෑම ප්‍රශ්න පත්‍රයකටම 40%ක් හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයින් කුසලතා අනුපිළිවෙල මත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දීම සිදු නොකරන අතර, සුදුසුකම් තහවුරු කළ අයදුම්කරුවන් විභාගයේදී ලබාගත් මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

08. ***විභාගය*** :-

මෙම විභාගය ලිඛිත ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විතය.

| *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| 2. පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය) | පැය 02 | 100 | 40 |

(i) මෙම විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

(ii) අපේක්ෂකයින් කැමති භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකි අතර, විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතු ය.

(iii) ඉල්ලීම් කරන ලද භාෂා මාධ්‍ය විභාගයේ දී වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

(iv) විභාග ගාස්තුව රු. 400

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට නිකුත් කරන ලද පේරාදෙණිය, තැපැල් කාර්යාලයෙන් මුදල් කර ගත හැකි වනසේ දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකින් ලබාගත් මුදල් ඇනවුමක් ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතු ය.

(v) විෂය නිර්දේශය :-

(*අ*) බුද්ධි පරීක්ෂණය - කාලය පැය 1 යි මුළු ලකුණු 100 යි. අපේක්‍ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.

(*ආ*) පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය : කාලය පැය 1 යි. මුළු ලකුණු 100 යි.

පහත දැක්වෙන විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

(i) *මැනීම සහ මට්ටම් ගැනීම :*
දම්වැල් ගැනීම — මට්ටම් ගැනීම
තියොඩලයිට්ටුව භාවිතය පිළිබඳ දැනුම — තලමේස මැනුම් පිළිබඳ දැනුම

(ii) ගොඩනැගිලි ද්‍රව්‍ය :
සිමෙන්ති, හුණු, වැලි, ගල්, තීන්ත වර්ග, වාර්නිෂ් වර්ග, ප්ලාස්ටික් සහ වීදුරු, ගොඩනැගිලි ද්‍රව්‍ය වශයෙන් යොද ගනු ලබන හොඳ තත්ත්වයේ දැව හඳුනා ගැනීමේ දැනුම

(iii) ගොඩනැගිලි ඉදි කිරීම හා ඇස්තමේන්තු පිළියෙල කිරීම අත්තිවාරම් බිත්ති බැඳීම, දැව වහලය, යකඩ කාප්ප, කුළුණු, කොන්ක්‍රීට් තලාද සහ කොන්ක්‍රීට් කුළුණු/අත්තිවාරම්/තට්ටු/තරප්පු ආදිය යොදනු ලබන ආකාරය සහ යොදනු ලබන අවස්ථා

මිනුම් ලබා ගැනීම, ඇස්තමේන්තු පිළියෙල කිරීම, ඉදි කිරීම සඳහා අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රමාණයන් සහ කම්කරුවන් සංඛ්‍යාව ඇස්තමේන්තු කිරීම.

(iv) ව්‍යුහ නම්‍යතා/ව්‍යාපෘති බල සටහන

(iv) සේවාවන් - විදුලි, ජල, සනීපාරක්ෂක

09. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනය සමග ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. 8 1/2 x 12 (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස් කර ගත් ඉල්ලුම්පත්‍රය 2017 ජුනි 12 වැනි දිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ ''තාක්ෂණ නිලධාරි III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ තරග විභාගය'' යනුවෙන් පැහැදිලිව සටහන් කල යුතුය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සටහන* :-

(i) රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් ස්වකීය ඉල්ලුම්පත්‍රය තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ.

(ii) සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී ඉල්ලුම්පත්‍ර නැතිවීම හෝ ප්‍රමාදවීම සම්බන්ධව කෙරෙන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(iii) ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. විභාගය පැවැත්වෙන දිනය පුවත්පත් දැන්වීමක් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ. ඉල්ලුම්කරුවන්ට විභාග ප්‍රවේශපත්‍රය විභාගය පැවැත්වෙන දිනයට දින හතරකට කලින් නොලැබුනහොත් පහත සඳහන් විස්තර ඇතිව වහාම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට දැන්විය යුතුය.

(i) අපේක්ෂකයන්ගේ සම්පූර්ණ නම

(ii) ලිපිනය

(iii) ඉල්ලුම්පත් තැපැල් කිරිමේ දිනය, ලියාපදිංචි අංකය, තැපැල් කාර්යාලය

10. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය.

(i) උප්පැන්න සහතිකය

(ii) අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් තහවුරු කිරීමේ සහතික

අපේක්ෂකයාගේ අනන්‍යතාවය :

විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක්ම විභාග ශාලාවේ දී තමාගේ අනන්‍යතාව විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් ඔප්පුකර සිටිය යුතුය. ඒ සඳහා පහත ලේඛන පිළිගැනේ.

(i) පුද්ගලයින් ලියාපදංචි කිරීමේ කොමසාරිස් නිකුත් කරන ලද හැඳුනුම් පත්‍රය.

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය (විභාග දිනට අවුරුදු 3කට කලින් නිකුත් කරන ලද)

සාවද්‍ය තොරතුරු සැපයීම :

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා යම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක හෝ ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට හැකි වන්නේය. අපේක්ෂකයෙකු ඉදිරිපත් කල කිසියම් තොරතුරක් සාවද්‍ය බව දූන දූන ඉදිරිපත් කල බව පෙනී ගියහොත් ඔහු සේවයෙන් පහ කිරීමට යටත් වන්නේය.

මෙම *ගැසට්* පත්‍රයේ 03 වන ඡේදයේ ප්‍රකාශිත රාජ්‍ය සේවයට පත් කිරීමට අදළ වන පොදු කොන්දේසි කෙරෙහි හා විභාග අපේක්ෂකයින් සඳහා නීති හා උපදෙස් කෙරෙහි අවධානය යොමු කර ඒවා පිළිපැදිය යුතුය.

11. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් පරස්පරතාවයන් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

12. මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් ගැන ගැටළුවක් මතු වුවහොත් ඒ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමේ බලය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සතුවේ. එය අවසන් තීරණය වේ.

වෛද්‍ය ආර්. එම්. ආරියදස,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (*වැ. බ.*)

2017 අප්‍රේල් මස 19 වැනි දින,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

*ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යංශය*

*සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව*

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ තාක්ෂණ නිලධාරි තනතුර සඳහා අයදුම්පත**

| | |
|---|---|
| විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය | |

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදළ කොටුව තුළ ලියන්න.)

01. නම :

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

:————. (උදා : ) SILVA B. A.

1.2 සම්පූර්ණ නම සිංහලෙන් :————.

1.3 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

02. 2.1 ලිපිනය :
පෞද්ගලික :————.
රාජකාරී ලිපිනය :————.
ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.
2.2 දුරකථන අංකය :————.

03. 3.1 ස්ත්‍රී පුරුෂ භාවය : (අදාළ කොටුව තුළ සළකුණු කරන්න.)

| | |
|---|---|
| ස්ත්‍රී | |
| පුරුෂ | |

3.2 උපන් දිනය :

වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

3.3 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට වයස :

අවුරුදු | | මාස | | | දින | | |

3.4 විවාහක අවිවාහක බව (අදාළ අංකය කොටුව තුළ සළකුණු කරන්න.)

| | |
|---|---|
| විවාහක | |
| අවිවාහක | |

04. අධ්‍යාපන සුදුසුකම් :-
4.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය

වර්ෂය :———. මාසය :———.

| විෂයය | ලබාගත් සාමාර්ථය | විභාග අංකය |
|---|---|---|
| | | |

4.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය

වර්ෂය :———. මාසය :———.

| විෂයය | ලබාගත් සාමාර්ථය | විභාග අංකය |
|---|---|---|
| | | |

4.3 (අ) වෘත්තීය සුදුසුකම් ලබාගත් ආයතනය :————.

4.4 වෘත්තීය සුදුසුකම් ලබාගත් වර්ෂය :————.

05. වර්තමාන රැකියාව හා කලින් දැරූ පත්වීම් (ඇත්නම් පමණක්)

| *තනතුර* | *ආයතනය* | *සිට* | *දක්වා* |
|---|---|---|---|
| | | | |

06. විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලයේ නම :———.

මුදල් ඇණවුම් අංකය :————.

> සම්පූර්ණ විභාග ගාස්තුව රු. 400 කි. දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකින් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට
>
> ගෙවන කාර්යාලය :- පේරාදෙණිය

07. මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවටත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(දැනට රජයේ ස්ථිර සේවයේ නියුක්ත නිලධාරීන්ට පමණක් අදාළ වේ.)

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

මෙම දෙපාර්තමේන්තුවේ .......................... ලෙස සේවය කරන ....................... මයා./මිය./මෙනවිය විසින් සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත් ඒවා නිවැරදි බවත් අපේක්ෂකයා/අපේක්ෂිකාව ඉහත තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කල හැකි/නොහැකි බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තැබිය යුතුය.)

පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

05-209

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය**
(ISO 9001 : 2008 තත්ව සහතිකයෙන් පිදුම්ලත් ආයතනයකි)

**නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය**

*ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා - 2017*

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හදාරා මුද්‍රණ ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ නිපුණයෙකු වන්න.

පාසැල් හැරගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණ කාලීන NVQ පාඨමාලාව
NVQ Training Programme in Offset Lithopress Operation for School Leavers (Full time)

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක්ව පවතින ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණ කාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩ සටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණයන්ත්‍ර ක්‍රියා කරවීම ඇතුලු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදාළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබාදේ. පුහුණුව අවසාන කිරීමෙන් පසු ඔවුන් රැකියා සඳහා අනුයුක්ත කෙරේ.

පාඨමාලා කාලය : මාස 14යි (පූර්ණ කාලීන) මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු.21,500

**මයික්‍රොසොෆ්ට් ඔෆිස් - Microsoft Office**

මෙම පාඨමාලාව තුළින් MS Office පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ පුහුණුවක් ලබා දෙන අතර පරිගණක භාවිතය පිළිබඳවද මූලික දැනුම හා අවබෝධය ද ලබාදේ. මෙම පාඨමාලාව පාසැල් හැරගිය නවකයන්ට මෙන්ම ආයතනවල රැකියාවන්හි නියුතු පුද්ගලයන්ට ද MS Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා දේ.

කාලය : මාස 04යි (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු.12,000

**පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණකරණය - Computer Graphic Design**

ග්‍රැෆික්, මුද්‍රණ හා මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ලෙස මෙම පාඨමාලාව සකස් කර ඇති අතර ඒ තුළින් අද ග්‍රැෆික් නිර්මාණයට අවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දෙයි. මෙම පාඨමාලාව පාසැල් හැරගිය සිසුන්ට හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ නියැළෙන පුද්ගලයන්ට මනා දැනුමද, පුහුණුවද ලබා දේ.

කාලය : මාස 04 1/2(අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල /ඉංග්‍රීසි

පාඨමාලා ගාස්තුව : ආයතනික සහතිකපත් පාඨමාලාව රු 16,500 NVQ සහතික පත් පාඨමාලාව රු. 20,500

**පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු සැකසීම**
Computer Typesetting and Layout Design

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මුද්‍රණ, ග්‍රැෆික්, ප්‍රචාරක හා ප්‍රකාශන ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස් වන අතර ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි.

කාලය : මාස 05යි (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල / ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු.13,500

**වෙබ් අඩවි නිර්මාණය -Web Designing**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ නවීන තාක්ෂණයට අනුකූලව පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබා දේ. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට හා මෙම ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

කාලය : මාස 4 යි (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු.16,500

**ඕෆ්සෙට් ලිතෝකරණය - Offset Lithography**

මෙම පාඨමාලාව තුළින් අද ප්‍රචලිතව පවතින ඕෆ්සෙට් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ දැනුමක් ලබාදේ. ඕෆ්සෙට් මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට මෙන්ම එම ක්ෂේත්‍රයට ඇතුල් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනයක් වනු ඇත.

කාලය : වසරයි (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු.17,500

### ත්‍රිමාණ සජීවීකරණය - Digital Animation

මෙම පාඨමාලාව තුළින් පරිගණක ආධාරයෙන් ද්විමාන සහ ත්‍රිමාණ චලන රූප නිර්මාණකරනය කිරීම සහ එම රූප, රූපවාහිනී සහ චිත්‍රපට මාධ්‍ය සඳහා යොදා ගන්නා අයුරු සවිස්තරාත්මකව පුහුණු කෙරේ.

කාලය : මාස 06 යි (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු.22,500/-

### පරිගණක දෘඩාංග එකලස් කිරීම සහ සැකසීම - Computer Hardware & Assembly

මෙම පාඨමාලාව තුළින් පරිගණක දෘඩාංග/මෘදුකාංග සහ පරිගණක එකලස් කිරීම පිළිබඳව මනා දැනුමක් සහ අවබෝධයක් ලබාදෙන අතර එදිනෙදා පැනනගින දෘඩාංග/මෘදුකාංගවල අදාළ තාක්ෂණික හා ප්‍රායෝගික ගැටළු විසඳා ගැනීමට මහත් සේ මෙම පාඨමාලාව ප්‍රයෝජනවත් වේ. නවකයන්ට මෙන්ම පරිගණක තාක්ෂණයේ නියැලි පුද්ගලයන්ට ද මෙම පාඨමාලාව එකසේ ප්‍රයෝජනවත් වනු ඇත.

කාලය : මාස 4 යි (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 12,500

### මුද්‍රණ ක්ෂේත්‍රයට අදල පිරිවැයකරණය සහ ඇස්තමේන්තුකරණය
### Costing and Estimating for Printers

මෙම පාඨමාලාව තුළින් මුද්‍රණ ක්ෂේත්‍රයට අදාල පිරිවැයකරණය හා ඇස්තමේන්තුකරණය (Job Costing and Estimating) පිළිබඳ පුළුල් අවබෝධයක් සහ දැනුමක් ලබාදේ. ග්‍රැෆික් සහ මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට මෙන්ම එම ක්ෂේත්‍රයට ඇතුළ්වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව ඉතා යෝග්‍ය වේ.

පාඨමාලා කාලය : වසර 1 යි (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු17,500

### පොත් බැඳීම හා නිමාකරණය - Book Binding & Finishing

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් ඇත. මේ තුළින් පොත් බැඳීම, නිමාව පිළිබඳ පුළුල් අවබෝධයක් හා න්‍යායාත්මක පුහුණුවක් ලබාදේ. මෙම පාඨමාලාව පාසැල් හැරගිය සිසුන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට ද මහත් ප්‍රයෝජනයක් වේ.

කාලය : මාස 07 යි (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 16,500

### ආංකික පෙර මුද්‍රණය - Digital Prepress

මුද්‍රණ, ග්‍රැෆික්ස්, ප්‍රචාරණ හා ප්‍රකාශන ක්ෂේත්‍රයන්හි නියැළි සේවක මහතුන්ට මෙම පාඨමාලාව අතිශයින් වැදගත් වේ. මේ තුළින් නවීන පෙර මුද්‍රණය පිළිබඳව පුළුල් අවබෝධයක් හා දැනුමක් ලබා ගත හැක.

පාඨමාලා කාලය : වසර 1 යි (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 21,500

### නොමිලේ සහභාගි විය හැකි සම්මන්ත්‍රණයක්

ග්‍රැෆික් සහ මල්ටිමීඩියා තාක්ෂණය සහ ඊට අදල මෘදුකාංග (Software) භාවිතය පිළිබඳව සම්මන්ත්‍රණයක් පැවැත්වෙන අතර, පොත් බැඳීම සහ නිමාව පිළිබඳ නොමිලේ සම්මන්ත්‍රණයක් මැයි මස 21 වන ඉරිදා උදේ 8.30 සිට සවස 1.30 දක්වා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ ශ්‍රවණාගාරයේ දී පැවැත්වේ. ඉඩකඩ සීමිත නිසා 011 2686162 හෝ 011 2679791 දුරකථන අංක අමතා ආසනයක් හැකි ඉක්මනින් වෙන්කරවා ගන්න.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා සියල්ල උසස් ප්‍රමිතියකට අනුව ක්‍ෂෙත්‍රයේ රැකියාවලට ගැලපෙන අයුරින් සකස්කොට ඇති අතර, පාඨමාලා සාර්ථකව නිමකරණ සිසුන් හට රජය හා ජාත්‍යන්තරව පිළිගත් වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

පාඨමාලා අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මුද්‍රණ අයතනය,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
අංක. 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.

දුරකථන : 011 2686162 , 011 2679791
ෆැක්ස් : 011 2686162 ඊමේල් : sliopdir@sltnet.lk වෙබ් අඩවිය : www.sliop.edu.lk

ශාඛා :
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
මාතලේ.
දුර : 0662222172
071 0554298

05-224

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### නොතාරිස් ප්‍රාරම්භ විභාගය 2016/2017

සිංහල භාෂාවෙන් හෝ දෙමළ භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට පත් කිරීම සඳහා පුහුණුව ලැබීම පිණිස ප්‍රතිඥාත ලිපිකරුවන් වශයෙන් බඳවා ගැනීමේ තරඟ විභාගයක් 2017 වර්ෂයේ අගෝස්තු මාසයේදී සිංහල සහ දෙමළ භාෂාවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම විභාගය උපලේඛනය I හි දක්වා ඇති නගරවල පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පමණක් පැවැත්වේ. අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් කළ යුතු විභාගයට පෙනී සිටීම සඳහා ඉල්ලුම් කරනු ලබන නගරය එම ලේඛනයට අනුවම විය යුතු බවත් ඉල්ලුම් කරනු ලබන නගරය පසුව වෙනස් කිරීමට ඉඩ නොදෙන බවත් සැලකිය යුතු ය. කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කර නොමැතිනම් ඔවුන්ගේ දෙවන මනාපය ලෙස දක්වන ලද නගරයේ හෝ ආසන්න, වෙනත් නගරයක පිහිටුවනු, ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ. තව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කොට නොමැතිනම්, විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

2.

i. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

ii. විභාග අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීති *ගැසට් නිවේදනයේ* වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝණය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදු වනවා ඇත.

3. මෙම විභාගයේ ප්‍රතිඵල මත ප්‍රතිඥාත ආධුනිකයින් සිය දෙනෙකු ජනවාර්ගික අනුපාතය හා දිස්ත්‍රික් පදනම මත ගරු ස්වදේශ කටයුතු ඇමතිතුමා විසින් පත් කරනු ඇත.

4. **සුදුසුකම්**

1. *අධ්‍යාපන සුදුසුකම් :-*

අපේක්ෂකයා -

i. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී ගණිතය, ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් හයකින් සමත් වී තිබිය යුතු අතර, එම විෂයයන්ගෙන් ඕනෑම විෂයයන් තුනකට සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතු ය; සහ

ii. අ.පො.ස (උසස් පෙළ) විභාගයේ දී විෂයයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වී තිබිය යුතුය.

ii. *වෙනත් සුදුසුකම් :-*

අපේක්ෂකයා

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

ii. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනයේදී වයස අවුරුදු විස්සට නොඅඩු සහ වයස අවුරුදු පනහට නොවැඩි විය යුතු ය.

* ඒ අනුව 1997/06/12 වැනි දිනට හෝ ඊට පෙර හා 1967/06/12 වැනි දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

iii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

iv. වෘත්තීය රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

v. අධිකරණයක් මගින් යම් සාපරාධී වරදකට වරදකරු කරනු ලැබ නොතිබිය යුතුය.

5. අයදුම්පත්‍රයේ අංක 01 සිට 06 තෙක් වූ ශීර්ෂ පළමුවන පිටුවට ද, ඉතිරිය 3 හා 4 පිටුවලට ද වන ලෙස අයදුම්පත්‍රය සකස් කළ යුතු අතර විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන මාධ්‍යයෙන් තම අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතු ය. අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය. එසේම නිවේදනයේ ඇතුළත් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත්‍රය යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද, යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර තිබේ ද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තු ගෙවා එහි විස්තර අයදුම්පතට ඇතුළත් කොට ලදු පත අලවා ඇත් ද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් විය යුතු ය. තව ද සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

i. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2017.06.12 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ''විභාග කොමසාරිස් ජනරාල්'' සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ'' යන ලිපිනයට එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ නොතාරිස් ප්‍රාරම්භ විභාගය 2016 (2017) ලෙස සඳහන් කරන්න.

ii. *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් .-* ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුයි. මේ විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරුක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය ධුරයෙන් පහ කිරීමට පුළුවන.

6. සෑම අපේක්ෂකයකු ම රුපියල් 500 ක මුදලක් විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ අදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක්/උප තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා

අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත, එහි එක් දරයක් මගින් අයදුම් පත්‍රයේ නිවරුදි ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. එම ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම, ප්‍රයෝජනවත් විය හැකි ය. විභාග ගාස්තු සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ.

7. *අනන්‍යතාවය.-* අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

ii. වලංගු විදේශ ගමන් බලපත්‍රයක්

7.1 අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරියකු, සාමදාන විනිශ්චයකාරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුද වේ අධිකාරීලත් නිලධාරීවරයකු, රු.240,360 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

7.2 විභාගය සඳහා පෙනී සිටින දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

8. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝණය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

9. *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාලසටහනේ පිටපතක් සමග විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනවා ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3 ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශපත්‍ර නොලැබුණිනම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ පිටපත ද, විභාග ගාස්තු ගෙවන ලද්දේ නම් ඊට අදාළ ලදුපතෙහි පිටපත ද අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද, සමග ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම් ඔබගේ ඉහත විස්තර සහ ෆැක්ස් අංකයක් ද සඳහන් කරන ලද (විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ඔබ වෙත ෆැක්ස් මඟින් එවීම සඳහා) ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මඟින් යොමු කිරීම වඩාත් ඵලදායී වනු ඇත.

*සටහන* : අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය.

10. මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පැවැත්වේ. විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

11.

11.1 *විභාග පරිපාටිය* :

අපේක්ෂකයන් පහත දැක්වෙන විෂයයන් ඇතුළත් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය. :-

| *අනු. අංකය* | *විෂය* | *ලකුණු* | *කාලය (පැය)* | *විෂය අංකය* |
|---|---|---|---|---|
| 1 | ගණිත හැකියාව | 100 | 02 | 01 |
| 2 | අවබෝධය | 100 | 02 | 02 |
| 3 | සාමාන්‍ය දැනීම | 100 | 01 | 03 |

11.2 *ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය/විෂය නිර්දේශය* :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය/ව්‍යුහය |
|---|---|
| ගණිත හැකියාව | අ.පො.ස. (සා. පෙළ) මට්ටමේ ගණිතමය හැකියාව මැනෙන ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. |
| අවබෝධය | අපේක්ෂකයා සතු භාෂා හැකියාව හා ව්‍යාකරණ පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්න පත්‍රයකි. වාක්‍ය රචනයක් ලිවීම, දෙන ලද පාඨයක් සාරාංශ කර ලිවීම, දෙන ලද පාඨයක් ඇසුරින් අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම, වැරදි ලෙස දෙනු ලබන වාක්‍ය කිහිපයක් ව්‍යාකරණානුකූලව නිවැරදි කොට ලිවීම, දෙන ලද වාක්‍ය කිහිපයක් සම්බන්ධ කොට ලිවීම යන හැකියාවන් මිනුම් කිරීම අපේක්ෂා කෙරේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. |

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය/ව්‍යුහය |
|---|---|
| සාමාන්‍ය දැනීම | ආර්ථික, සමාජ, සංස්කෘතික, දේශපාලන, විද්‍යාත්මක, ක්‍රීඩා, සෞඛ්‍ය, නීතිමය, ආදී ක්ෂේත්‍රවල ජාතික හා අන්තර්ජාතික කාලීන සිදුවීම් ඇතුළත් බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත වන ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. |

12. මේ සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවෙන් හෝ විභාග දෙපාර්තමේන්තුවෙන් කිසිදු සම්මන්ත්‍රණයක් හෝ පාඨමාලාවක් පවත්වනු නොලබන අතර, බාහිර ආයතන විසින් පවත්වනු ලබන කිසිදු සම්මන්ත්‍රණයක් හෝ පාඨමාලාවක් සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව හෝ විභාග දෙපාර්තමේන්තුව කිසිදු වගකීමක් භාර නොගන්නා බව සැළකිය යුතු ය.

13. සාමාර්ථය සඳහා එක් එක් විෂයට නියමිත මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතලිහක් (40%) බැගින් ලබාගත යුතු වේ.

14. විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් අපේක්ෂකයා විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍ය පදනම් කර ගනිමින් දිස්ත්‍රික් මට්ටමේ කුසලතා අනු පිළිවෙලට දක්වමින් පරීක්ෂණයේ ප්‍රතිඵල වාර්තාව සමඟ විභාග අයදුම්පත්‍රය ද රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත යවනු ලැබේ.

1. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත විභාග ප්‍රතිඵල දැනුම් දීම විභාග කොමසාරිස් ජනරාල් මගින් තැපැලේ හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය මගින් සිදු කෙරෙනු ඇත.

15. තෝරාගත් අපේක්ෂකයින්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

16. තරග විභාගයේ ප්‍රතිඵල මත අවශ්‍ය අපේක්ෂකයන් සංඛ්‍යාව රෙජිස්ට්‍රාර් ජනරාල් වරයා විසින් තෝරා ඒ එක් එක් අපේක්ෂකයාට ප්‍රතිඥාත ආධුනිකයකු වශයෙන් ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකුට සේවය කිරීම සඳහා බලපත්‍රයක් ලබා දෙනු ලැබේ.

17. මෙම විභාග නිවේදනය සිංහල, දෙමළ, ඉංග්‍රීසි, භාෂාත්‍රයෙන්ම පළ කරනු ලබන අතර, එම භාෂා පද මාලා අතර යම් අනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල භාෂා පදමාලාව බලාත්මක වන බව සැළකිය යුතුය. මෙම විභාගය පැවැත්වීමේ රෙගුලාසි සම්බන්ධයෙන් අවසාන තීරණය රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ තීරණය වේ.

18. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

නීල් ද අල්විස්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2017 අප්‍රේල් මස 28 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
බත්තරමුල්ල දී ය.

## නොතාරිස් ප්‍රාරම්භ විභාගය - 2016 (2017)

## *Notary's Preliminary Examination - 2016 (2017)*

* විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය (අදාල අංකය කොටුව තුළ ලියන්න)
සිංහල - 2
දෙමළ - 3 ☐

* *ගැසට් නිවේදනය* අනුව ඉල්ලුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය හා නගර අංකය සඳහන් කරන්න. (විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර සහ නගර අංක සඳහා උපලේඛන - I බලන්න)

| නගරය | නගර අංකය |
|---|---|
| 1 | |
| 2 | |

* ජන වර්ගය ☐

| | | | |
|---|---|---|---|
| සිංහල | - 1 | මුස්ලිම් | - 4 |
| ලංකා දෙමළ | - 2 | බර්ගර් | - 5 |
| ඉන්දියානු දෙමළ | - 3 | වෙනත් | - 6 |

01. 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : GUNAWARDHANA M. G. B. S. K.

1.2 මුලකුරු සමග නම :————.
(සිංහලෙන් හෝ දෙමළෙන්)

1.3 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

1.4 සම්පූර්ණ නම :————.
(සිංහලෙන් හෝ දෙමළෙන්)

02. 2.1 ස්ථිර පදිංචි ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
(උපලේඛන 1 ට අනුව අංකය යොදන්න)

2.3 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. ජාතික හැඳුනුම්පත් අංකය :

04. ස්ත්‍රී පුරුෂ භාවය : ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) පුරුෂ - 0

05. උපන් දිනය (අදාළ අංකය කොටුව තුළ ලියන්න) : වර්ෂය මාසය දිනය

5.1 2017.06.12 වැනි දිනට වයස : අවුරුදු මාස දින

06. දුරකථන අංකය :

07. ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥ...……… මහතා යටතේ ප්‍රතිඥාත ආධුනිකයෙකු වශයෙන් මම සේවය කිරීමට අදහස් කරමි.

08. වෘත්තියේ නියැලීමට මා අදහස් කරන අධිකරණ කළාපය සහ භාෂාව පිළිවෙලින් ……… (කලාපය) සහ ………භාෂාව වේ.

09. විභාග ගාස්තු :

| | | |
|---|---|---|
| i. | විභාග ගාස්තු ගෙවූ කාර්යාලය | ……………………………………………… |
| ii. | ලදුපත් අංකය හා දිනය | ……………………………………………… |
| iii. | ගෙවූ මුදල | ……………………………………………… |

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.

(ලදු පතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ.)

10. මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදු විය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. තව ද, මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

11. මවිසින් සපයා ඇති තොරතුරු අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

12. තව ද, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට යටත් බව ද ප්‍රකාශ කරමි.

13. මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

14. අයදුම්කරුගේ අත්සන :————.
දිනය :————.

*අයදුම්කරුගේ අත්සන සහතික කිරීම*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................. මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු /ඇය මා ඉදිරිපිට දී ............... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

උපලේඛනය I

විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංක

| නගරය | නගර අංකය |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වව්නියාව | 12 |
| මුලතිව් | 13 |
| කිලිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොලොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොනරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

05-404

## කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය

### කම්කරු දෙපාර්තමේන්තුවේ ලඝුලේඛක III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයට අයත් කම්කරු දෙපාර්තමේන්තුවේ ලඝු ලේඛක III ශ්‍රේණියේ සිංහල මාධ්‍ය තනතුරු පහක (05) හා ඉංග්‍රීසි මාධ්‍ය තනතුරු හතරක (04) පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *පත් කිරීම* :
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මගින් පවත්වනු ලබන ලිඛිත හා වෘත්තීය පරීක්ෂණවල ප්‍රතිඵල අනුව සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

02. *සුදුසුකම්* :

2.1 අධ්‍යාපන සුදුසුකම් :

I. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගය සමත් වීම;

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගයේ දී (නව විෂය නිර්දේශය යටතේ සාමාන්‍ය පොදු පරීක්ෂණය සහ සාමාන්‍ය ඉංග්‍රීසි හැර) අවම වශයෙන් එක් විෂයයකින් හෝ සමත් වීම.

2.2 වෘත්තීය සුදුසුකම් :

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක ලඝු ලේඛනය පිළිබඳ මාස හය (06) කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගයේ දී යතුරු ලියනය හා ලඝු ලේඛනය විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

*සටහන.*—ලඝු ලේඛනය හා පරිගණක යතුරු ලියනය සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ආයතන පහත දැක්වේ :-

- කාර්මික හා අධ්‍යාපන පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කාර්මික විද්‍යාල හා තාක්ෂණ විද්‍යාල
- ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියට අයත් පුහුණු මධ්‍යස්ථාන
- ජාතික තරුණ සේවා සභාවට අයත් පුහුණු මධ්‍යස්ථාන
- ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට අයත් පුහුණු මධ්‍යස්ථාන

2.3 පලපුරුද්ද :
ඉහත පාඨමාලාවෙන් පසු රජයේ පිළිගත් ආයතනයකින් මාස 06 ක ප්‍රායෝගික පුහුණුවක් ලබා තිබීම.

2.4 වෙනත් සුදුසුකම් :

I. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
II. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

03. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය.

04. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

4.1 මෙම තනතුර ස්ථිරය. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට නිලධාරීන් යටත් විය යුතුවේ.

4.2 මෙම පත්වීම අවුරුදු තුනක (03) පරිවාස කාලයකට යටත් වේ.

4.3 III ශ්‍රේණියට බඳවා ගෙන වසර තුනක් (03) ගත වීමට පෙර I වන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

4.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 අනුව හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත සේවයට බැඳුනු භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබා ගත යුතු අතර රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

4.5 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට සහ ඒවායේ සිදු කෙරෙන සංශෝධන වලට ද, දෙපාර්තමේන්තු ගත අනෙකුත් නියෝගවලට ද, 2013.04.11 වැනි දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම බඳවා ගැනීම් පරිපාටියට මින් මතු කෙරෙන සංශෝධනවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයින් ලඝු ලේඛක III ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ.

4.6 කොළඹ 05, නාරාහේන්පිට පිහිටි කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ පමණක් සේවයේ යොදවනු ලැබේ.

05. තනතුරට අදාළ වැටුප් ක්‍රමය ඃ

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 පරිදි MN 1 - 2016 අනුව 27,140 -10x300 - 11x350 - 10x495 - 10x660- 45,540/= මාසික වැටුප් පරිමාණයක් හිමිය. (2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව MN 1 - 2016 වැටුප් කාණ්ඩය - එම චක්‍රලේඛයේ II වන උප ලේඛනයේ සඳහන් පරිදි ගෙවීම් සිදු කරනු ලැබේ.)

06. බඳවා ගැනීමේ ක්‍රමය ඃ

මෙම බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය ලිඛිත පරීක්ෂණයකින් හා වෘත්තීය පරීක්ෂණයකින් සමන්විතය. පළමුව ලිඛිත පරීක්ෂණය පැවැත්වෙන අතර එම ප්‍රශ්න පත්‍රයෙන් 40% ට වඩා ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් වෘත්තීය පරීක්ෂණයට කැඳවනු ලැබේ. මෙම විභාගය තරඟ විභාගයක් බැවින් පත්වීම ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් 40% ක් බැගින් වත් අපේක්ෂකයින් විසින් ලබා ගත යුතුය. තරඟ විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් මුළු ලකුණු අනුපිළිවෙල අනුගමනය කරමින් පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ. (මෙම දැන්වීමේ සඳහන් සුදුසුකම් සියල්ලම සපුරා තිබීම අනිවාර්ය වේ.

විභාගය සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. සිංහල මාධ්‍ය තනතුරු සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන් සිංහල මාධ්‍යයෙන්ද, ඉංග්‍රීසි මාධ්‍ය තනතුරු සඳහා ඉල්ලුම්කරන අයදුම්කරුවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන්ද විභාගයට පෙනී සිටිය යුතුමය. සිංහල මාධ්‍ය අයදුම්කරුවන්ගේ මුළු ලකුණු කුසලතාව අනුව සිංහල මාධ්‍ය තනතුරු සඳහා ද, ඉංග්‍රීසි මාධ්‍ය අයදුම්කරුවන්ගේ මුළු ලකුණු කුසලතාව අනුව ඉංග්‍රීසි මාධ්‍ය තනතුරු සඳහා ද පත් කිරීම සිදු කරනු ලැබේ.

6.1 ලිඛිත විභාගය සඳහා වන විෂය නිර්දේශය

| *ප්‍රශ්න පත්‍රය* | *ලකුණු* | *සමත් ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| සාමාන්‍ය දැනීම සහ වාක්‍ය රචනය (සිංහල/ඉංග්‍රීසි) | 100 | 40% | පැය 02 |

(අ) ලිඛිත විභාගයේ විෂයය නිර්දේශය ඃ

*සාමාන්‍ය දැනීම හා වාක්‍ය රචනය*

දේශීය හා ජාත්‍යන්තර ක්ෂේත්‍රවල කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය දැනීම පරීක්ෂා කිරීම, කාලීන වැදගත්කමින් යුත් දෙන ලද මාතෘකා අතුරින් තෝරාගත් මාතෘකාවක් යටතේ රචනාවක් ලිවීම.(සුවිශේෂී අදහස් ඉදිරිපත් කිරීම, භාෂා කුසලතාව, නිවැරදි ව්‍යාකරණ හා අක්ෂර වින්‍යාසය කෙරෙහි සැලකිල්ලක් දක්වනු ලැබේ.)

6.2 වෘත්තීය පරීක්ෂණය

| *විෂයය* | *ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|
| ලඝුලේඛනය හා පරිගණක යතුරු ලියනය (සිංහල/ඉංග්‍රීසි) | 100 | 40% |

(අ) *වෘත්තීය පරීක්ෂණය සඳහා වන විෂය නිර්දේශය*

(i) සිංහල ලඝු ලේඛනය හා යතුරු ලියනය
මිනිත්තු පහක් (5) තුළ නොකඩවා කියවනු ලබන ඡේදයක් මිනිත්තුවකට වචන 70 ක වේගයෙන් ලඝු සටහන් කරගෙන එම සටහන් මිනිත්තුවකට වචන 7 ක වේගයෙන් පරිගණක යතුරු ලියනය කිරීම;

හෝ

(ii) ඉංග්‍රීසි ලඝු ලේඛනය හා යතුරු ලියනය
මිනිත්තු පහක් (5) තුළ නොකඩවා කියවනු ලබන ඡේදයක් මිනිත්තුවකට වචන 80 ක වේගයෙන් ලඝු සටහන් කරගෙන එම සටහන් මිනිත්තුවකට වචන 7 ක වේගයෙන් යතුරු ලියනය කිරීම.

07. විභාග ගාස්තු:

මෙම විභාගය සඳහා වන ගාස්තුව රු.500.00 කි. එම විභාග ගාස්තුව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය නමින් ඇති පැලවත්ත ලංකා බැංකු ශාඛාවේ අංක 0071451995 දරණ ගිණුමට බැර කර ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පත්‍රයට නොගැලවෙන සේ අලවා එවිය යුතුය. ගෙවනු ලබන විභාග ගාස්තුව කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ. කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

08. අයදුම් කිරීමේ ක්‍රමය ඃ

8.1 මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 ප්‍රමාණයේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් ඃ

(අ) අංක 01 සිට 2.4 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද, අංක 03 සිට 05 දක්වා ඡේදයන් දෙවන පිටුවටද, අංක 06 සිට 09 (ඇ) දක්වා ඡේදයන් තෙවන පිටුවටද ඉතිරිය අනෙක් පිටුවටද වන ලෙස සකස් කළ යුතු අතර අදාල තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව සම්පූර්ණ කළ යුතුය.

(ආ) අයදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල මාධ්‍ය අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අදාළ නොවන, නියමිත දිනට විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත් සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුවේ. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ

කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳ අයදුම්කරුවන් විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් ඉල්ලුම්පත ප්‍රතික්ෂේප විය හැකිය.

8.2 මෙම විභාගය 2017 ජූලි මස කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

8.3 නිවේදනයේ සඳහන් සුදුසුකම් සහිත බව දක්වමින් එම නිවේදනයට අනුකූලව සකසා ඇති නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන්ට නියමිත සුදුසුකම් සපුරා ඇතැයි යන පූර්ව නිගමනය මත තරග විභාගයට පෙනී සිටීමට ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉඩ දෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට්* නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අසත්‍ය තොරතුරු සපයා ඇති බව හෝ අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

8.4 අයදුම්පත් එවිය යුතු ආකාරය ඃ

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2017.06.16 වැනි දින හෝ එදිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, අංක 267, පන්නිපිටිය පාර, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ''කම්කරු දෙපාර්තමේන්තුවේ ළඝු ලේඛක තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය 2017'' යන්න සඳහන් කළ යුතුය. තැපෑලේ දී අස්ථානගතවන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව වග කියනු නොලැබේ.

8.5 අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු, රු.28,650 ක් හෝ ඊට වැඩි හෝ මාසික වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

*ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්* ඃ

ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාග යේ නීති රීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක අපේක්ෂකත්වය අවලංගු කරනු ඇත. පත්වීම් ලැබීමෙන් පසුව හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු යටපත් කර ඇති බව අනාවරණය වුවහොත් ඔහු/ ඇය රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පිළිවන.

09. විභාගයට පෙනී සිටීමඃ

විභාගය පවත්වන දිනට සතියකට කලින් ලැබෙන සේ විභාග ප්‍රවේශපත්‍ර ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ඇත. එවැනි විභාග ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය සඳහා පෙනී සිටින අයදුම්කරුවන් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන් සහතික කරවා ගත් ප්‍රවේශපත්‍ර ඉදිරිපත් කළ යුතුය.

අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ මුදල් ගෙවූ කුවිතාන්සියේ සහ ලියාපදිංචි කළ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපතක් ද, සමග ඔබගේ විමසීම ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

10. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. ඃ-

(*අ*) පුද්ගලයින් ලියාපාදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

11. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංගනය කළහොත් ජාතික ශ්‍රම අධයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවේ.

12. මෙම විභාගය පැවැත්වීම, පත්වීම් ලබාදීම හා අනෙකුත් සියළුම කරුණු පිළිබඳ අවසන් තීරණය කම්කරු කොමසාරිස් ජනරාල් සතු වන්නේය.

*සටහන* ඃ මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය වලින් පළවී ඇති නිවේදන වල කිසියම් පරස්පර විරෝධී බවක් ඇත්නම් නිවැරදි ලෙස සලකන්නේ සිංහල භාෂාවෙන් පළකර ඇති නිවේදනය බව කරුණාවෙන් සළකන්න.

කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 අප්‍රේල් මස 18 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
නාරාහේන්පිට,
කොළඹ 05.

ආදර්ශ අයදුම්පත්‍රය

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

**කම්කරු දෙපාර්තමේන්තුවේ ලඝුලේඛක III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017**

**The Open Competitive Examination for the Recruitment to the Post of Stenographer (Grade III) in the Department of Labour - 2017**

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 1
ඉංග්‍රීසි - 2 ☐

01. 1.1 අයදුම්කරුගේ මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (උදා : SILVA. A. B. D. P. A.)
1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

1.5 ස්ත්‍රී/පුරුෂ භාවය (අදාළ අංකය කොටුව තුළ ලියන්න.) ස්ත්‍රී - 1 පුරුෂ - 0 ☐

02. 2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)
2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය
(i) සිංහලෙන්/දෙමළෙන් :————.
(ii) ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.

2.4 දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

03. 3.1 විවාහක/අවිවාහක බව : අවිවාහක - 1 විවාහක - 2
(අදාළ කොටුව තුළ ලියන්න.) ☐

3.2 උපන් දිනය :

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.3 අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස :

අවු. ☐☐ මාස ☐☐ දින ☐☐

04. අධ්‍යාපන සුදුසුකම් :

4.1 අ. පො. ස. (සා. පෙළ) විභාගය :
(i) විභාගයේ වර්ෂය හා මාසය : වර්ෂය :————. මාසය :————.
(ii) විභාග අංකය :————.

(iii) ප්‍රතිඵල :

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

4.2 අ. පො. ස. (උ. පෙළ) විභාගය :

(i) විභාගයේ වර්ෂය හා මාසය : වර්ෂය :————. මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :

| විෂයය | සාමාර්ථය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

05. වෘත්තීය සුදුසුකම් :

| පාඨමාලාවේ නම | කාල සීමාව | ආයතනය |
|---|---|---|
| | | |

06. පළපුරුද්ද :

| පුහුණුව ලැබූ හෝ සේවය කළ ආයතනයේ නම | කාල සීමාව |
|---|---|
| | |

07. ඔබ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකට දඬුවම් ලැබ තිබේ ද? (අදළ කොටුවේ ( ✓ ) ලකුණ යොදන්න.

| ඔව් | | නැත | |
|---|---|---|---|

එසේ දඬුවම් ලැබ ඇත්නම් ඒ කුමන වරදක් සඳහා කවර අධිකරණයකින් කවර දඬුවමක් ලැබ ඇත් ද යන තොරතුරු සපයන්න.

08. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :
(i) විභාග ගාස්තු ගෙවූ ලංකා බැංකු ශාඛාවේ නම :————.
(ii) කුවිතාන්සි අංකය හා දිනය : අංකය :————. දිනය :————.

(iii) ගෙවූ මුදල :————.

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. |
|---|

09. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් තොරතුරක් සම්පූර්ණ නොකිරීමෙන් සහ /හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් විය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලුම තොරතුරු නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ආ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට අනුකූලව ක්‍රියා කිරීමටත් මෙම කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගයෙන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන තීරණයන් පිළිගැනීමට මා එකඟ වෙමි.

(ඇ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශනය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්වීම ලැබීමට නුසුදුස්සෙකු වන බවත් පත්වීම ලැබීමෙන් පසු වුවද සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවද මම දනිමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..........................මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ............ වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

05-210

---

## ඇක්වයිනස් උසස් අධ්‍යාපන ආයතනයේ වැවිලි කළමනාකරණ පීඨයේ ඩිප්ලෝමා පාඨමාලාවන්ට 2017 වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය

- වැවිලි කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව
- කෘෂිකර්ම ඉංජිනේරුවිද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව

| | | |
|---|---|---|
| කාල සීමාව | : | මාස 26 යි. |
| දේශන | : | සති අන්ත සෙනසුරාද දිනවල උදේ 10.00 - 3.00 දක්වා |
| මාධ්‍යය | : | සිංහල/ඉංග්‍රීසි මිශ්‍ර |

ආහාර විද්‍යාව සහ තාක්ෂණය ඩිප්ලෝමා පාඨමාලාව
සත්ත්ව පාලනය ඩිප්ලෝමා පාඨමාලාව
මල් වගාව හා උද්‍යාන අලංකරණය ඩිප්ලෝමා පාඨමාලාව

| | | |
|---|---|---|
| කාල සීමාව | : | මාස 26 යි. |
| දේශන | : | සති අන්ත ඉරිදා දිනවල උදේ 10.00 - 3.00 දක්වා |
| මාධ්‍යය | : | සිංහල/ඉංග්‍රීසි මිශ්‍ර |

ඉහත පාඨමාලාවන්ට 2017 වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය 2017 මැයි මස 27 හා 28 දිනයන්හි පෙ. ව. 10.00ට ඇක්වයිනස් ආයතනයේ දී පැවැත්වේ.

05-335

---

සංශෝධනයයි

**රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සහ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 (II) සහ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017 (I)

2017.04.12 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද උක්ත කාර්යක්ෂමතා කඩඉම් විභාග නිවේදනයේ 12.8.3 (III) ඡේදය, 14.2 ඡේදය සහ ඉංග්‍රීසි භාෂාවෙන් පළවූ නිවේදනයේ 13 ඡේදය පහත පරිදි සංශෝධනය කෙරේ. ඃ

(i) විභාග නිවේදනයේ 12.8.3 (III) ඡේදය පහත පරිදි සංශෝධනය විය යුතු ය ඃ-

(III) වර්තමාන ජාත්‍යන්තර ආර්ථික අර්බුද හා ඒවායින් ශ්‍රී ලංකා ආර්ථිකයට සිදුවන බලපෑම (විෂය අංකය 23) (ලකුණු 100)
වර්තමාන ජාත්‍යන්තර ආර්ථික අර්බුද හා ඒවායින් ශ්‍රී ලංකා ආර්ථිකයට සිදුවන බලපෑම (ඒ ඒ අවස්ථාවේ ඇතිවන ලෝක ආර්ථික තත්ත්වයන්ට කාලීනව ගැළපෙන මාතෘකාවලට අදළව පිළිතුරු සැපයීමට සිදුවේ.)

***සටහන*** - මෙම විෂයය සඳහා අපේක්ෂකයකු අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු වේ.

(ii) විභාග නිවේදනයේ 14.2 ඡේදය මගින් දක්වෙන වගුව වෙනුවට පහත වගුව ආදේශ විය යුතු ය ඃ-

| | අංක 1419/3 හා 2005.11.14 දිනැති පූර්ව සේවා ව්‍යවස්ථාව | අංක 1842/2 හා 2013.12.23 දි නැති නව සේවා ව්‍යවස්ථාව |
|---|---|---|
| 01. | නීතිය<br>(පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | නීතිය<br>(පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| 02. | පරිපාලනය<br>(පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | පරිපාලනය<br>(පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| 03. | ආර්ථික විද්‍යාව හෝ සමාජ විද්‍යාව<br>(පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | ආර්ථික විද්‍යාව හා සමාජ විද්‍යාව<br>(පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| 04. | රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය<br>(දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය<br>(පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| 05. | ඉංග්‍රීසි<br>(පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | සන්ධාන භාෂා ප්‍රවීණතාව<br>(දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |

| | අංක 1419/3 හා 2005.11.14 දිනැති පූර්ව සේවා ව්‍යවස්ථාව | අංක 1842/2 හා 2013.12.23 දි නැති නව සේවා ව්‍යවස්ථාව |
|---|---|---|
| 06. | ආර්ථික හා සමාජ ප්‍රතිපත්තිය (දෙවන කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය) | ආර්ථික හා සමාජ ප්‍රතිපත්තිය (දෙවන කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය) |
| 07. | සංවර්ධන පරිපාලනය පිළිබඳ ක්‍රියාවලිය (දෙවන කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය) | සංවර්ධන පරිපාලනය පිළිබඳ ක්‍රියාවලිය (දෙවන කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය) |
| 08. | කළමනාකරණය සහ සංවිධානය (දෙවන කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය) | කළමනාකරණය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය (දෙවන කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය) |

(iii) ඉංග්‍රීසි නිවේදනයේ 13 ඡේදය යටතේ දක්වෙන විභාග කාල සටහනෙහි අනු අංක 9 පහත පරිදි සංශෝධනය විය යුතු ය :-

| | | | | | |
|---|---|---|---|---|---|
| 09. | 2nd Efficiency Bar Examination for Officers of Sri Lanka Planning Service | Techniques of Development Planning | 21 | 2017.07.16 | 12.30p.m. - 3.30 p. m. |
| | | Basic Macro Economics | 22 | 2017.07.22 | 9.00a.m. -12.00 p. m. |
| | | Current International Economic Crises and their impact on Sri Lankan Economy | 23 | 2017.07.22 | 12.30p.m.- 3.30p.m. |

*සටහන :*

(*අ*) මෙම සංශෝධන හේතුවෙන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017 (I) සඳහා අයදුම්පත් යොමු කළ හැකි අවසාන දිනය 2017.05.29 දින දක්වා දීර්ඝ කරනු ලැබේ.

(*ආ*) **විභාගයට දෙවන වර පෙනී සිටින නිලධාරීන්** විභාග ගාස්තු ගෙවීම සම්බන්ධව පහත උපදෙස් අනුගමනය කළ යුතුවේ :-

(i) විභාග ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් විභාග නිවේදනයේ 6 වන ඡේදයේ සඳහන් විධිවිධාන තවදුරටත් බලපැවැත්වෙන අතර ඒ අනුව දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ එක් විෂයයකට අයදුම් කරන ලද අයදුම්කරුවකු මෙම සංශෝධනය හේතුවෙන් තවත් විෂයයකට අයදුම් කරන්නේ නම් අමතර රු. 500 ක විභාග ගාස්තුවක් ගෙවිය යුතුවේ.

(ii) යම් හෙයකින් මීට පෙර විභාග නිවේදනයට අනුව දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂයයන් කිහිපයකට අයදුම් කරන ලද අයදුම්කරුවකු මේ වන විටත් රු. 1000 ක විභාග ගාස්තුවක් ගෙවා ඇති බැවින් මෙම සංශෝධනය හේතුවෙන් මෙම විභාගයේ තවත් විෂයයකට හෝ විෂයයන් කිහිපයකට අයදුම් කරන්නේ නම් අමතර විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ.

(*ඇ*) දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට මේ වන විටත් (2017 (I)) අයදුම් කර ඇති අයදුම්කරුවකු දෙවන වරටද විභාග ප්‍රවේශ පත්‍රයක් බාගත කළ යුතුවේ. විභාගයට ඉදිරිපත් වීමේදී වලංගු වනුයේ එම දෙවන වරට බාගත කරගත් ප්‍රවේශ පත්‍රය වේ.

(*ඈ*) මේ සම්බන්ධයෙන් කිසියම් ගැටළුවක් මතුවුවහොත් ඒ පිළිබඳව විමසීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 011-5980236 දුරකථන අංකය 2017.05.29 දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පෙ. ව. 8.30 සිට ප. ව. 4.15 දක්වා විවෘතව ඇත.

(*ඉ*) මෙම සංශෝධන හේතුවෙන් විභාගය පවත්වන දිනයන්හි වෙනසක් සිදු නොවේ.

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.

2017 ක් වූ මැයි මස 04 වැනි දින,
කොළඹ 07,
නිදහස් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ දී ය.

05-576

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.